# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2393/15 – 2024 ජූලි මස 16 වැනි අඟහරුවාදා – 2024.07.16**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2020/212

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.10.30 දිනැති හා අංක 2356/05 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.10.18 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් නුගතලාව, රාමලංකාවත්ත, අයි. සී. එම්. බංගලාවෙහි පදිංචි එච්. එම්. කේ. කුඩාබණ්ඩාර මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් 1. කොළඹ 05, කිරුළ පාර, අංක 200, හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, 2. බදුල්ල, මයිලගස්තැන්න පාර, අංක 03, බස් සමවායෙහි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති A/64/2023 හා 2024.05.08 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජුනි මස 20 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 042255 – 11 (2024/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/04/2020/212

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

එච්. එම්. කේ. කුඩාබණ්ඩාර මයා,
අයි. සී. එම්. බංගලාව,
රාමලංකා වත්ත,
නුගතලාව.

*පළමුවන පාර්ශ්වකරු*

*එදිරිව*

ආරාවුල් අංකය: A/64/2023

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
   අංක 200,
   කිරුළ පාර,
   කොළඹ 05.

2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
   බස්සමවාය,
   අංක 03,
   මයිලගස්තැන්න පාර,
   බදුල්ල.

*දෙවන පාර්ශ්වය*

**බේරුම්කරණ ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) පනත්වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව ඉහත දෙපාර්ශ්වය අතර පැන නැගී ඇති ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මත්තේගොඩ, කුඩමාදුව, ද විලේජ් හි අංක 202/බී/61 පදිංචි නීතිඥ විජේසූරිය ආරච්චිගේ ජයවික්‍රම වන මා 2023.10.18 වැනි දින පත් කරනු ලැබීය.

ඒ අනුව කම්කරු කොමසාරිස් ජනරාල් බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතාගේ අංක IR/COM/04/2020/212 හා 2023 අගෝස්තු මස 22 දිනැති ලේඛනය මගින් ඉහත දෙපාර්ශ්වය අතර කාර්මික ආරාවුලට හේතු වී ඇති කරුණ වශයෙන් "ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බදුල්ල බස්සමවායේ සේවය කරන ලද එච්. එම්. කේ. කුඩාබණ්ඩාර මහතාට 2015.11.30 දිනැති ලිපිය මගින් කාර්යභාර ඉංජිනේරු තනතුර ආවරණය කිරීම සඳහා කරන ලද පත්කිරීම මෙතෙක් ස්ථිර නොකිරීම මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත් අසාධාරණයක් සිදුව තිබේ නම් හිමි විය යුතු සහන කවරේද යන්නත් විසඳීම සඳහා බේරුම්කරු වශයෙන් මා වෙත යොමු කර ඇත."

මේ අනුව දෙපාර්ශ්වය 2023.11.15 දින කම්කරු දෙපාර්තමේන්තුවේ බේරුම්කරණ අංශයට කැඳවනු ලැබීය. දෙපාර්ශ්වයම එදින බේරුම්කරු ඉදිරියේ දී පෙනී සිටි අතර ප්‍රථමයෙන්ම කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් මා වෙත ලබා දී ඇති බේරුම්කරණයට අදාළ ආරාවුලේ යොමුව පැහැදිලි කර දුන් අතර එම යොමුව නිවැරදි බවට දෙපාර්ශ්වයේම අත්සන් තබා ලිඛිතව සනාථ කරනු ලැබීය. අනතුරුව මෙම ආරාවුල නිරවුල් කිරීමේ පරිපාටිය වශයෙන් ඉදිරිපත් වී ඇති යොමුව සංශෝධනය වන්නේ ද යන්න විමසූ අතර එවැනි සංශෝධයක් නොමැති බව පාර්ශ්වකරුවන් ප්‍රකාශ කළ හෙයින් සමථයක් මගින් මෙම ආරාවුල නිරවුල් කිරීමට උත්සාහ කරන බවත් සුවිශේෂී හේතුවක් මත පමණක් සාක්ෂි විමසීමක් සිදු කරන බවත් එසේ නොමැත්තේ නම් ලිඛිත ප්‍රකාශ හෝ දිවුරුම් ප්‍රකාශ මගින් පාර්ශවයන්ගේ ලේඛන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන බවත් දෙපාර්ශ්වයටම දන්වා සිටින ලදී. එමෙන්ම මෙම බේරුම්කරණය අවසානයේ දී කිසියම් පාර්ශ්වයක් මූල්‍යමය සහනයක් අපේක්ෂා කරන්නේ නම් එම අපේක්ෂිත මූල්‍යමය සහනයට අදාළ ලේඛන පැහැදිලිව ඉදිරිපත් කළ යුතු බව පෙනවා දුනිමි. එමෙන්ම මෙම කරුණ සම්බන්ධව කිසියම් අධිකරණයක නඩු කටයුත්තක් පවතින්නේ නම් එය වාර්තා වූ වහාම විභාගය අත්හිටුවන බව පාර්ශ්වයන්ට පැහැදිලි කර දුනිමි.

පරීක්ෂණය ආරම්භ කරන අවස්ථාව වන විටම පළමුවන පාර්ශ්වකරු සක්‍රීය සේවයේ නියුතු අයෙකු නොවන බවත් මේ වන විට විශ්‍රාම ලබා ඇති බවත් පළමුවන පාර්ශ්වකරු කියා සිටි අතර තමා සක්‍රීය සේවයේ යෙදී සිටිය දී තමාට සිදු වූ අසාධාරණය සම්බන්ධව කම්කරු දෙපාර්තමේන්තුවෙන් මැදිහත්වීම අපේක්ෂාවෙන් ඉල්ලීමක් කළ බවත් ඒ අනුව අද දින පරීක්ෂණයට පැමිණි බවත් පළමුවන පාර්ශ්වකරු කියා සිටින ලදී. දෙවන පාර්ශ්වයේ නීතිඥවරිය ප්‍රකාශ කර සිටියේ දෙවන පාර්ශ්වය වෙනුවෙන් නම් කර ඇති දෙවන ආයතනය වන බදුල්ල බස්සමවාය නෛතික පුද්ගලයෙකු නොවන බවයි. ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජිත ආයතනයක් වන බදුල්ල බස්සමවාය තමන් පිළිගන්නා බව පළමුවන පාර්ශ්වය කියා සිටින ලදී.

ඉහත මූලික කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව මෙම කාර්මික ආරාවුල නිරවුල් කිරීම සඳහා 2023.11.24, 2024.01.04, 2024.02.07, 2024.02.28 හා 2024.03.25 යන දින වල දෙපාර්ශ්වයන් කැඳවූ අතර එහිදී හැකි තරම් උත්සාහ කරනු ලැබුවේ පාර්ශ්වයන් අතර එකඟතාවයකින් ආරාවුල නිරවුල් කිරීමටය.

පළමුවන පාර්ශ්වකාර එච්. එම්. කේ. කුඩාබණ්ඩාර මයා ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ මූලික පුහුණුව ලැබීමෙන් අනතුරුව 1986.08.21 වැනි දින සිට ලංකා ගමනාගමන මණ්ඩලයේ කහගොල්ල ප්‍රාදේශීය වැඩපලෙහි දෙවන පොළ මිල්රයිට් කාර්මිකයෙකු වශයෙන් සේවයට බැඳී ඇත. පසුව වර්ෂ 2004 අගෝස්තු 06 වැනි දින පළමුවන පාර්ශ්වකරු ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඉංජිනේරු පරීක්ෂක 1 ශ්‍රේණියට බඳවාගෙන ඇති අතර එම තනතුරෙහි සේවය ස්ථිර කරනු ලැබීය. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ප්‍රාදේශීය මණ්ඩල කීපයක් බවට එවකට සිටි රජය කටයුතු කිරීමත් පසුව නැවතත් සියලුම ප්‍රාදේශීය මණ්ඩල ඒකාබද්ධ කිරීමත් හේතුවෙන් පළමුවන පාර්ශ්වකරු අවස්ථා 02 කදී සේවය ස්ථිර කරනු ලැබීමක් සිදුකරනු ලැබීය.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බදුල්ල බස්සමවායේ පස්වන ශ්‍රේණියේ කාර්යභාර ඉංජිනේරු තනතුර සඳහා අංක ශ්‍රීලංගම/මාසක/වලේ/2015 හා 2015 ඔක්තෝබර් 05 වැනි දිනැතිව ප්‍රධාන මානව සම්පත් කළමනාකරු අයදුම්පත් කැඳවා ඇති අතර එම තනතුර සඳහා පළමුවන පාර්ශ්වකරු ඉල්ලුම් කර ඇති අතර එම ඉල්ලීමට අනුකූලව 2015.11.12 වැනි දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තිබුණි. එම සම්මුඛ පරීක්ෂණයේ දී ඔහුට ලකුණු 54ක් ලබාගෙන ඉහළම ලකුණුලාභියා වී ඇති නමුත් ප්‍රධාන මානව සම්පත් කළමනාකරු විසින් ඔහු වෙත කාර්යභාර ඉංජිනේරු තනතුරු ලබා දී නොමැත. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන මානව සම්පත් කළමනාකරුගේ අංක ශ්‍රීලංගම/මාසක/ආවරණපත්/විධා/42/2015 හා 2015 නොවැම්බර් 30 දරන ලිපියෙන් කාර්යභාර ඉංජිනේරු තනතුර ආවරණය කර ගැනීම සඳහා පත්වීම් ලිපියක් නිකුත් කර ඇති අතර එම ලිපියේ පිටපතක් 2024 ජනවාරි 04 වැනි දින පළමුවන පාර්ශ්වකරු විසින් සිය ලිඛිත දේශන සමග X2 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කර ඇත.

මෙම ප්‍රශ්නගත කාර්මික ආරාවුලට හේතුව වන්නේ ඉහත පරිදි පත් කරන ලද රාජකාරි ආවරණය කිරීමට කරන ලද පත් කිරීම ස්ථිර පත්වීමක් බවට පත් කර ගැනීමය. ඒ අනුව 2019.03.27 වැනි දින බදුල්ල කම්කරු කාර්යාලයේ දී පළමුවන පාර්ශ්වකරු හා ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජිතයෙකු අතර ප්‍රථම සාකච්ඡාව පවත්වා ඇති අතර එම සාකච්ඡාව සම්බන්ධව ප්‍රධාන මානව සම්පත් කළමනාකරු විසින් ඔහුගේ අංක ශ්‍රීලංගම/මාසක/කම්සහ/පැමි/විභාග/01/2019 හා 2019.04.11 දිනැති ලිපිය (X3 ලිපිය) මගින්

ප්‍රධාන මානව සම්පත් කළමනාකරු දන්වා සිටින්නේ පස්වන ශ්‍රේණියේ කාර්යභාර ඉංජිනේරු තනතුර සඳහා පළමුවන පාර්ශ්වකරු ඉල්ලුම් කළ බවත් ඔහු ඉහළම ලකුණුලාභියා වී ලකුණු 54ක් ලබාගත් බවත් දැනට කාර්යභාර ඉංජිනේරු තනතුරු ආවරණය කර ගැනීම සඳහා පත්වීමක් ලබා දී ඇති බවත්ය. එමෙන්ම ඔහු වැඩිදුරටත් දන්වා සිටින්නේ කම්කරු නිලධාරිගේ නිර්දේශ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කරන බවයි. ඒ අනුව කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්මික සබඳතා අංශය සහකාර කම්කරු කොමසාරිස් විසින් අංක IR/COM/04/2020/212 හා 2021.04.19 දිනැති ලිපිය මගින් ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති වෙත දන්වා සිටින්නේ ඉහත දැක්වූ ප්‍රධාන මානව සම්පත් කළමනාකරුගේ ලිපිය අනුව පළමුවන පාර්ශ්වකරුට (පැමිණිලිකරුට) අසාධාරණයක් සිදු වී ඇති බවට අනාවරණය වන බැවින් ඒ අනුව අදාළ ශ්‍රේණියේ පිහිටුවා උසස්වීම් ලබා දීමට කටයුතු කරන ලෙසයි. ඒ සඳහා මාස 02 ක කාලයක් ද ලබා දී ඇත. (X4 ලිපිය)

ඉහත පරිදි කම්කරු දෙපාර්තමේන්තුව මගින් ලබා දී තිබූ උපදෙස් අනුව කටයුතු නොකිරීම හේතුවෙන් මෙම ආරාවුල බේරුම්කරණයෙන් නිරවුල් කිරීම සඳහා මා වෙත යොමුව තිබුණි. මේ සම්බන්ධව පාර්ශ්වකරුවන් ඔවුන්ගේ ලිඛිත දේශන ඉදිරිපත් කළ අතර දෙවන පාර්ශ්වය වෙනුවෙන් පැමිණි නීති නිලධාරිනි ප්‍රකාශ කර සිටියේ පළමුවන පාර්ශ්වකරු ප්‍රාථමික සේවා පුහුණු (PL1 ගණයට) අයත් බවත් එම ප්‍රාථමික ගණයේ කාර්ය මණ්ඩලයේ වැටුප් ප්‍රතිව්‍යුහගතකරණය යටතේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති බවත් ඒ අනුව ඔහු නියමිත වැටුප් තලයන්හි පිහිටුවා ඇති බවත් ය. ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රාථමික ගණයේ තනතුරු හැර සෙසු ඉහළ තනතුරු එනම් කළමනාකරණ සහකාර තනතුරේ සිට සාමාන්‍යාධිකාරි දක්වා වන තනතුරු සඳහා ප්‍රතිව්‍යුහගතකරණය යටතේ තනතුරු නාමයන් සහ වැටුප් තලයන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර නොමැති හෙයින් පළමුවන පාර්ශ්වකරු ඉල්ලා සිටින කණිෂ්ඨ කළමනාකරු සේවා ගණය (JM) ලබා දිය නොහැකි බවයි. මෙහිදී බේරුම්කරු වශයෙන් මා විමසා සිටියේ කාර්යභාර ඉංජිනේරු තනතුරු ආවරණය කරන ඉංජිනේරු පරීක්ෂක පළමු පෙළ තනතුරු දරන්නෙකු ප්‍රාථමික ගණයට හෙවත් PL1 ගණයට අයත් වන්නේ කෙසේ ද යනුවෙනි. ඒ පිළිබඳ පැහැදිලි කර ගැනීම සඳහා බදුල්ල බස්සමවායේ නඩත්තු කරනු ලබන ලේඛන භාර නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව ගෙන්වා ගතිමි. පළමුවන පාර්ශ්වකරුගේ පුද්ගලික ලිපිගොනුව මා පෞද්ගලිකව පරීක්ෂා කළ අතර රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනයක නිලධාරියෙකු වෙනුවෙන් නඩත්තු කළ යුතු පෞද්ගලික ලිපි ගොනුවක තිබිය යුතු ලේඛන වලින් තොර වීම සුවිශේෂී කරුණකි. විශේෂයෙන් පළමුවන පාර්ශ්වකරුගේ ලිපිගොනුවේ සටහන් පත්‍ර හෙවත් මිනිට් ෂීට් කිසිවක් නොවීය. වැටුප් වර්ධක ලබා දී ඇත්තේ විෂය භාර කළමනාකරණ සහකාරවරයා විසිනි. එම ලේඛන අධීක්ෂණ නිලධාරියෙකු හෝ මාණ්ඩලික නිලධාරියෙකු අත්සන් කර නොමැත. පළමුවන පාර්ශ්වකරු ප්‍රාථමික සේවා ගණයට අයත් බව තීරණය කර ඇත්තේ අදාළ ගොනුව භාර කළමනාකරණ සහකාරවරයා විසිනි. ඒ සඳහා කිසිදු අනුමැතියක් ලබාගෙන නොමැත. පෞද්ගලික ලිපි ගොනුවක් යනු කිසියම් නිලධාරියෙකුගේ රාජකාරි ජීවන චක්‍රයයි. පෞද්ගලික ලිපි ගොනුවක් ඇසුරෙන් නිලධාරියාගේ රැකියාවේ ආරම්භයේ සිය අවසානය දක්වා අනුපිළිවෙලට ඔහුගේ රාජකාරි ජීවිතය ගොඩනගාගෙන ඇති ආකාරය පැහැදිලි කර ගත හැකිය. නමුත් එවැනි තත්ත්වයක් මෙම පෞද්ගලික ලිපි ගොනුවේ දක්නට නොලැබුණි. මේ නිසා පෞද්ගලික ලිපි ගොනුව භාරව කටයුතු කළ නිලධාරිනිය දැනටමත් සේවයේ යෙදී සිටීම නිසා ඇය කැඳවීමට කටයුතු කළ නමුත් ඇය වෙනුවට පැමිණියේ බදුල්ල බස්සමවායේ ගණකාධිකාරිවරයාය. පසුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන) මහතා ද පරීක්ෂණය සඳහා ගෙන් වූ අතර පෞද්ගලික ලිපිගොනුවේ නඩත්තුවේ අඩුපාඩුව සම්බන්ධව ඔහුට ද පෙන්වා දුන් අතර පෞද්ගලික ලිපිගොනු නඩත්තු කරන කාර්ය මණ්ඩලය සඳහා විධිමත් පුහුණුවක් ලබාදීමේ අවශ්‍යතාවය පැහැදිලි කර දුනිමි.

මෙම පරීක්ෂණය සඳහා බදුල්ල බස්සමවායේ ගණකාධිකාරිගේ අංක ශ්‍රීලංගම/බදු/බසම/ගික/2023 හා 2023.12.19 දිනැති ප්‍රධාන මූල්‍ය කළමනාකරණ තැන මගින් සහකාර නීති නිලධාරි අමතන ලද ලිපිය දෙවන පාර්ශ්වයේ නීතිඥ විසින් මොසමක් මගින් 2023.12.27 වැනි දින ගොනු කර ඇත. එම ලේඛනය අනුව දැනට PL කාණ්ඩයට අයත් පළමුවන පාර්ශ්වකරු 2015.12.01 දින සිට 2023.06.23 වැනි දින එනම් විශ්‍රාම ගන්නා දිනය දක්වා කාලය තුළ ඔහුට පස්වන ශ්‍රේණියේ විධායක ඉංජිනේරු තනතුරු හිමි වූයේ නම් ගෙවීමට නියමිත වැටුපත් ගෙවූ වැටුපත් අතර වෙනස හිඟ මුදලක් වශයෙන් ගණනය කොට ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2015.12.01 සිට 2023.06.23 දක්වා කාලය තුළ පළමුවන පාර්ශ්වකරුට පස්වන ශ්‍රේණිය ලබා දුන්නේ නම් තවදුරටත් ගෙවිය යුතු හිඟ

මුදල වශයෙන් රු. 89,898/-ක් ගෙවිය යුතු බව දක්වා ඇත. පළමුවන පාර්ශ්වකරු සිය නියෝජිත මගින් 2024.02.07 වැනි දින විවෘත විභාගයේ දී ඉදිරිපත් කළ ඒ ලේඛනය අනුව 2015.12.01 සිට 2023.06.23 දින දක්වා පස්වන ශ්‍රේණියට අදාළ වැටුප් හා දීමනා ගණනය කර ඉදිරිපත් කොට ඇත. එම ගණනය කිරීම් අනුව පළමුවන පාර්ශ්වකරුට ගෙවූ වැටුප හා හිමි වැටුප අතර වෙනස වශයෙන් දක්වා ඇත්තේ රු. 91,148/-ක මුදලකි. ඒ අනුව පළමුවන පාර්ශ්වකරු ඉල්ලා සිටින ලද මුදලත් දෙවන පාර්ශ්වකරු එකඟ වන මුදලත් අතර වෙනස ඇත්තේ රු. 1250/-කි. ඒ සම්බන්ධව පාර්ශ්වකරුවන්ට ඔවුන්ගේ විභාගය අවසානයේ දී ඉදිරිපත් කරන ඔවුන්ගේ ලිඛිත දේශන වලින් කරුණු පැහැදිලි කරන ලෙසට දන්වා සිටිමි.

මෙම විභාගයට 2024.02.28 දින පැමිණි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන) දන්වා සිටියේ පළමුවන පාර්ශ්වකරු කණිෂ්ඨ කළමනාකරු වැටුප් කාණ්ඩය (JM) ඉල්ලා සිටිය ද ඒ වන තෙක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් මාණ්ඩලික නිලධාරීන් සඳහා වැටුප් හා තනතුරු ප්‍රතිව්‍යුහගතකරණය අනුමත කර නොමැති බවත් එය ඉදිරි සති 02, 03 තුළ අනුමත වන බවත්ය. අනතුරුව 2024.03.25 වැනි දින දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීති නිලධාරිනිය මා වෙත ඉදිරිපත් කර සිටියේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් උසස් කිරීමේ පරිපාටිය 2024.02.01 දින අනුමත කර 2024.02.14 වැනි දින ඔවුන් වෙත එවා තිබුණ ද එම ලේඛනය වැටුප් කාණ්ඩ 10කට අයත් නිලධාරීන් 3000 කට පමණ බලපාන හෙයින් පළමුවන පාර්ශ්වකරුට එය අදාළ කර ගැනීම මෙම විභාගය නියෝගයෙන් පසුව සිදු කළ හැකි බවයි. විශේෂයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උසස් කිරීමේ පටිපාටියේ ආවරණ ලිපිය අනුව එම උසස් කිරීම් 2017.03.17 වැනි දිනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලයට අදාළ වන බැවින් එය පළමුවන පාර්ශ්වකරුට ද අදාළ වන බව පැහැදිලි කර දුනිමි. ඒ අනුව මෙම විභාගය තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැති බවත් පාර්ශ්වයන්ට 2024.03.25 දින සිට 2024.04.30 දක්වා මසකට අධික කාලයක් ලිඛිත දේශන ගොනු කිරීමට කාලය ලබා දුනිමි. නමුත් 2024.04.30 වන වි කිසිදු පාර්ශ්වයක් ලිඛිත දේශන යොමු කර නොමැත. පසුව තවත් එක් සතියක් එනම් 2024.05.07 දින දක්වා ලේඛන ගොනු නොකළ බව නිරීක්ෂණය වීමත් මෝසමක් මගින් හෝ කාලය ඉල්ලා සිටීමක් සිදු නොකිරීම මත ලිඛිත දේශන නොමැතිව පැවති විභාගය අනුව ප්‍රදානය ලබාදීමට තීරණය කළෙමි.

ඒ අනුව කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් මා වෙත යොමු කළ යොමුව අනුව පහත පරිදි මගේ තීරණය ලබා දෙමි.

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බදුල්ල බස්සමවායේ සේවය කරන ලද එච්. එම්. කේ. කුඩාබණ්ඩාර මහතා 2015.11.30 දිනැති ලිපිය මගින් කාර්යභාර ඉංජිනේරු තනතුර ආවරණය කිරීම සඳහා කරන ලද පත්කිරීම මෙතෙක් ස්ථිර නොකිරීම මගින් අසාධාරණයක් සිදුව තිබේ ද?

   *පිළිතුර :* කාර්යභාර ඉංජිනේරු තනතුර සඳහා ඉදිරිපත් වී ඉහළම ලකුණු ලබා සිටි පළමුවන පාර්ශ්වකරුට කිසිදු සාධාරණ හෝ යුක්තිසහගත හේතුවකින් තොරව එම තනතුර ලබා නොදීමත් එම තනතුරේ රාජකාරි ආවරණය කිරීමට පත් කිරීමත් හේතුවෙන් අසාධාරණයක් සිදු වී ඇති බව තීරණය කළෙමි. ඒ අනුව 2015.12.01 දින සිට කාර්යභාර ඉංජිනේරු තනතුරේ ස්ථිර කළ යුතු බවට තීරණය කරමි.

2. එසේ අසාධාරණයක් සිදුව තිබේනම් හිමි විය යුතු සහන කවරේ ද?

   *පිළිතුර :* 1. පළමුවන පාර්ශ්වකරු 2015.12.01 දින සිට කාර්යභාර ඉංජිනේරු තනතුරේ පිහිටුවීමටත් එදින සිට විශ්‍රාම යන දිනය වන තෙක් ඔහුට හිමි විය යුතු වැටුප් වර්ධක හිමි කර දීමත්

   2. බදුල්ල බස්සමවායේ ගණකාධිකාරි විසින් 2023.12.19 දිනැතිව මෙම නඩුවට ගොනු කර ඇති ලේඛනය අනුව පස්වන ශ්‍රේණියට හිමි වැටුපත් ගෙවූ වැටුපත් අතර වෙනස වශයෙන් දක්වා ඇති රු. 89,898/- ක මුදල පළමුවන පාර්ශ්වකරුට දෙවන පාර්ශ්වය විසින් ගෙවිය යුතු වේ.

3. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උසස්වීමේ පරිපාටිය 2024.02.01 වැනි දින අනුමත කර ඇති හෙයින් හා එම උසස්වීම් 2017.03.17 වැනි දින සිට බලපැවැත්වෙන බැවින් 2017.03.17 දින සිට පළමුවන පාර්ශ්වකරු විශ්‍රාම ගන්වා ඇති 2023.06.23 දින දක්වා වූ කාලය සඳහා නව තනතුර හා ඊට අදාළ වැටුප් තල ලබා දී එයින් එම කාලයට අදාළ ගෙවූ වැටුප අඩුකර ශේෂය මෙම නියෝගය ලබා දුන් දින සිට මාස 06ක් තුළ දෙවන පාර්ශ්වය විසින් ගෙවා නිම කළ යුතුය.

මෙම ප්‍රදානයට අදාළ මුදල් ප්‍රදානය ගැසට් පත්‍රයේ පළවූ දින සිට මසක් තුළ බදුල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බවට නියම කරමි. එමෙන්ම මෙම ප්‍රදානය හේතු කොටගෙන පළමුවන පාර්ශ්වයකාර එච්. එම්. කේ. කුඩාබණ්ඩාර මහතාට හිමි විය යුතු වෙනත් ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හිමි කර ගැනීම සඳහා මෙම ප්‍රදානය බාධාවක් නොවිය යුතුය.

ඉහත තීරණය සාධාරණ හා යුක්තිසහගත බවට තීරණය කරමි.

**නීතිඥ ඩබ්ලිව්. ඒ. ජයවික්‍රම.**

2024 මැයි මස 08 වැනි දින.

EOG 07 - 0149

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.